Article 12 (1)

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. }

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2019-10-30

| | | |
|---|---|---|
| පැමිණිලි පාර්ශවය | : | කේ. කේ. එල්. කේ. කුලතිලක මයා,<br>විතානගේ වත්ත, දාපිලිගොඩ,<br>අගලවත්ත. |
| වගඋත්තරකාර පාර්ශවය | : | 01. වසන්තා කුලසේකර මිය,<br>විදුහල්පති,<br>සී. ඩබ්. ඩබ්. කන්නන්ගර ජාතික පාසල,<br>මතුගම. |
| | | 02. ලේකම්,<br>අධ්‍යාපන අමාත්‍යාංශය,<br>ඉසුරුපාය, බත්තරමුල්ල. |
| | | 03. අතිරේක ලේකම් (විමර්ශන අංශය),<br>අධ්‍යාපන අමාත්‍යාංශය,<br>ඉසුරුපාය, බත්තරමුල්ල. |

<u>පැමිණිලි අංකය : HRC/33/17</u>

**පැමිණිලි පාර්ශවයේ කරුණු දැක්වීම :-**

උක්ත පැමිණිලිකරු විසින් 2017-01-05 දාතමින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තමා ඉහත ලිපිනයෙහි පදිංචිව සිටින බවත්, 2017 වසරේ පළමු ශ්‍රේණිය සඳහා තම දියණිය මතුගම, සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මධ්‍ය විද්‍යාලයට ඇතුළත් කිරීම සඳහා ආදි ශිෂ්‍ය පදනම සහ ආසන්නතා පදනම යටතේ අයදුම් කරන ලද බවත්ය. සම්මුඛ පරීක්ෂණයේදී ආදි ශිෂ්‍ය ගණය යටතේ ලකුණු 74ක් ලබා ගත් බවත්, ඉන්පසුව පැවැති අභියාචනා හා විරෝධතා පරීක්ෂාවේදී තවත් එක් ලකුණක් එකතු වී තම ලකුණු සංඛ්‍යාව 75 දක්වා වැඩි වූ බවත්, කෙසේ වෙතත් අභියාචනා විරෝධතා පරීක්ෂාවෙන්



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson } 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / E-mail } sechrc@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone } 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary } 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline } 1996
වෙබ් / இணையம் / Web } www.hrcsl.lk

පසුව අවසන් ලේඛන ප්‍රසිද්ධ කිරීමේදී විදුහල්පතිනියගේ මැදිහත් වීම මත අභියාචනා විරෝධතා මණ්ඩලය මගින් ලබා දී ඇති ලකුණු වෙනස් කර අවසන් ලේඛනය සකස් කර ඇති බවත්, ඒ හේතුවෙන් තමන්ට අගතියක් සිදු වී ඇති බවත්, ඒ අනුව තම දියණිය පොරොත්තු ලේඛනයේ 02 වන ස්ථානයට පැමිණීම හේතුවෙන් තම දියණිය 2017 වසරේ ආදි ශිෂ්‍ය ගණය යටතේ ඉහත පාසලට ඇතුලත් කර ගැනීමට හැකියාව ලැබී නොමැති බවත් සඳහන් කර ඇත.

ඒ අනුව ඉහත විදුහල්පතිනියගේ නීතිවිරෝධී සහ පක්ෂපාතී ක්‍රියාකලාපය හේතුවෙන් තම මූලික අයිතිවාසිකම් කඩ වී ඇති බව ප්‍රකාශ කරමින් මේ සම්බන්ධව කඩිනම් විමර්ශනයක් සිදු කර තම දියණිය ඉහත පාසලට ඇතුලත් කර ගැනීම සඳහා නිර්දේශයක් ලබා දෙන ලෙස ඉල්ලා සිට ඇත.

වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම –:

පැමිණිලි පාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද චෝදනා සම්බන්ධයෙන් 2017-08-29 දාතමින් ලිඛිත කරුණු දැක්වීමක් ඉදිරිපත් කර ඇති විදුහල්පති වසන්තා කුලසේකර මිය, ප්‍රකාශ කර ඇත්තේ, පැමිණිලිකරු තමාට එරෙහිව ඉදිරිපත් කරන චෝදනා පිළිනොගන්නා බවත්, OB 109 යටතේ අයදුම්කර ඇති ආර්. එස්. ගමඇතිගේ යන අය වෙත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු 80ක් ලබා දී අභියාචනා විරෝධතා පරීක්ෂාවේදී එම ලකුණු ප්‍රමාණයෙන් 05ක් අඩු කර ඔහුගේ මුළු ලකුණු ප්‍රමාණය 75 වූ නමුත් අවසන් ලේඛනය සකස් කිරීමේදී ඔහුට ප්‍රමුඛතාවය ලබා දීමට කටයුතු කර ඇති බවත්, පැමිණිලිකරු වන කුලතිලක මහතාගේ මුළු ලකුණු 74 අභියාචනා විරෝධතා පරීක්ෂාවේදී තවත් 01 ලකුණක් එකතු වී ලකුණු 75ක් ලබා දී තිබුණත්, එම ලකුණ ලබා දීම සම්බන්ධව තමාට එකග විය නොහැකි වුවත්, අවසන් ලේඛන ප්‍රසිද්ධ කිරීමේදී ලකුණු 75ක් ඔහු වෙත ලබා දී ඇති බවත් සඳහන් කර ඇත.

කෙසේ වෙතත් මෙහිදී පැමිණිලිකරු හට අගතියක් සිදු වන ආකාරයෙන් තමා කටයුතු කර නොමැති බව සඳහන් කර ඇත. තවද වගඋත්තරකාර පාර්ශවය මේ සම්බන්ධව සිදු කරන ලද වැඩිදුර විමර්ශනයේදී ප්‍රකාශ කර ඇත්තේ පැමිණිලිකරු විසින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත තමන්ට එරෙහිව පැමිණිලි කර ඇති බැවින්, සම්මුඛ පරීක්ෂණය සහ අභියාචනා විරෝධතා පරීක්ෂාවට අදාලව පරිහරණය කරන ලද සියලුම ලේඛන අමාත්‍යාංශයේ විනය හා විමර්ශන ශාඛාව විසින් රැගෙන ගොස් ඇති බවයි.

විමර්ශනය :-

මෙම පැමිණිල්ල සම්බන්ධ විමර්ශනය සඳහා අවස්ථා කිහිපයකදී පාර්ශවකරුවන් කැඳවා ඇති අතර, ඒ අනුව පැමිණිල්ල සමථයකට පත් කිරීම සඳහා පරීක්ෂණ නිලධාරි උත්සහ ගෙන ඇතත්, ඒ සඳහා වගඋත්තරකාර පාර්ශවය තම අනුකූලතාවය පල කර නොමැත. කෙසේ වෙතත් විෂයගත කාරණයට අදාලව පැමිණිලිකරු විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ විනය හා විමර්ශන

අංශය වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇති අතර, ඒ සම්බන්ධව සිදු කරන විමර්ශනයේදී පැමිණිලිකරුට සාධාරණය ඉටු කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නියෝග කොට ඇති බව 2018-10-30 දිනැතිව කොමිෂන් සභාව වෙත ලබා දී ඇති ලිඛිත කරුණු දැක්වීම අනුව ප්‍රකාශ කර ඇත.

2018-10-30 දින මෙම පැමිණිල්ලට අදාලව පැවති පරීක්ෂණයේදී අධ්‍යාපන අමාත්‍යාංශය නියෝජනය කරමින් ඉහත සහභාගි වූ සහකාර අධ්‍යක්ෂ ප්‍රදීප් නිශාන්ත මහතාගේ වාචික කරුණු දැක්වීම අනුව එම කරුණු වැඩිදුරටත් සනාථ කර ගැනීම සඳහා ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් චමනි වික්‍රමතිලක මිය (විනය හා විමර්ශන) විසින් 2017 වසර පළමු ශ්‍රේණියට දරුවන් ඇතුලත් කර ගැනීමට අදාලව සිදු කරන ලද විමර්ශනයේ ප්‍රතිඵල වාර්තාව මගින් ප්‍රකාශ කර ඇත්තේ මෙම ප්‍රශ්නගත පැමිණිල්ලේ පැමිණිලිකරු වන කුලතිලක මහතාට තම දියණිය මතුගම සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මධ්‍ය විද්‍යාලයේ 2017 පළමු ශ්‍රේණියට ඇතුලත් කර ගැනීම සඳහා ඉදිරිපත්ව ඇති සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සහ අභියාචනා විරෝධතා පරීක්ෂාවේදී ඔහු ප්‍රකාශ කරන පරිදි අගතියක් සිදුව ඇති බවයි. තවද ඒ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සිදුකරන ලද පරීක්ෂණයේදී මෙම පැමිණිලිකරු ආදි ශිෂ්‍ය ගණයේ හා සහෝදර ගණය යටතේ අයදුම්පත්‍ර දෙකක් ඉදිරිපත් කර ආදි ශිෂ්‍ය ගණය යටතේ ලකුණු 75 ක් ලබා සිටියදී ආදි ශිෂ්‍ය 28, 52, 101 හා 57 යන අයදුම්කරුවන්ගේ දරුවන් වැරදි ලෙස ලකුණු ලබාගෙන එම පාසලට ඇතුලත් වී ඇති බැවින් අසාධාරණයක් සිදුව ඇති බව අනාවරණය වී ඇති බවත්,

මෙහිදී ආදි ශිෂ්‍ය ගණය යටතේ මතුගම සී.ඩබ්.ඩබ් කන්නන්ගර ජාතික පාසලේ පළමු ශ්‍රේණියට ඇතුලත් වීමට හිමිකම් ඇති OB - 21 දරණ අයදුම්කරු වූ කේ.කේ.එල්.කේ කුලතිලක මහතාගේ දියණියට අසාධාරණයක් සිදුවී ඇති බවට උක්ත විමර්ශනයේදී කරුණු අනාවරණය වී ඇති බැවින් ඉදිරියේදී එම දියණියට සාධාරණයක් ඉටු කිරීමට කටයුතු කිරීමට අධ්‍යාපන ලේකම් විසින් නියෝග කර ඇති බවත් සඳහන් කර ඇත.

ඒ අනුව පැහැදිලිවම අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සිදුකළ විමර්ශනයේදී පැමිණිලිකරුගේ දියණියට අගතියක් වී ඇති බව පිළිගෙන ඇති බැවින්(2018.10.30 දාතම අධ්‍යාපන අමාත්‍යාංශයේ ලිපිය හා ඇමුණුම අනුව) පැමිණිලිකරුගේ දියණිය සබැඳිව අධ්‍යාපන අමාත්‍යාංශය කටයුතු කළයුතු බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

ඒ අනුව පැමිණිල්ලට අදාලව ඉදිරිපත් වී ඇති සමස්ථ කරුණු අනුව වගඋත්තරකාර විදුහල්පතිනියගේ ක්‍රියාකලාපය හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට පරීක්ෂණයෙන් අනතුරුව තීරණය කරනු ලැබේ.

නිර්දේශය =:

මෙම පැමිණිල්ල සම්බන්ධව සිදු කරන ලද වැඩිදුර විමර්ශනයේදී වගඋත්තරකරුවකු ලෙස අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සහ අධ්‍යක්ෂ ජාතික පාසල් වෙනුවෙන් අවසන් වතාවට පැවැති පරීක්ෂණය නියෝජනය කර ඇති සහකාර අධ්‍යක්ෂ නිතිඥ ප්‍රදීප් නිශාන්ත මහතා ප්‍රකාශ කර ඇති පරිදි අධ්‍යාපන අමාත්‍යාංශයේ විනය හා විමර්ශන අංශය මගින් ප්‍රශ්නගත කාරණයට අදාලව සිදු කර ඇති විමර්ශනයේ දී මෙම පැමිණිලිකරුට අගතියක් සිදුව ඇති බවට අනාවරණය කර ගෙන ඇති බැවින් සහ ඒ අනුව ඔහු වෙත සාධාරණය ඉටු කිරිම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත විමර්ශන නිලධාරින් විසින් වාර්තා කර ඇති බැවින් සහ ඒ අනුව අධ්‍යාපන ලේකම් විසින් මෙම පැමිණිලිකරුට සාධාරණය ඉටු කිරිම සඳහා නියෝග කර ඇති බව අනාවරණය වන බැවින්. පැමිණිලිකරුගේ දියණිය මතුගම සී. ඩබ්. ඩබ්. කන්නන්ගර විද්‍යාලයේ සමාන්තර ශ්‍රේණියකට ඇතුලත් කර ගන්නා ලෙස අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කටයුතු කළ යුතුය.

2019. 11 .29 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුල කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර. එදිනට පෙර අදාල දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

පිටපත - ගරු අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් මහතා,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

Commissioner
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

B/